# ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල අභ්‍යන්තර ගුරු සංවර්ධන ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

හඳගිරියේ සිරිසුමන හිමි[1], මිනුවන්ගොඩ ඤාණාවාස හිමි[2],
ඉඹුලමුරේ විමලරතන හිමි[3]

## හැඳින්වීම

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ මුඛ්‍ය සාධක ද්වය ශිෂ්‍යයා හා ගුරුවරයා ය. ජාතික අධ්‍යාපනයෙහි අපේක්ෂිත අරමුණ වන පූර්ණ මිනිසෙකු බිහි කිරීමේ අරමුණ සාධනයෙහිලා උපයෝගී වන ප්‍රධාන සාධකය ගුරුවරයා ය. එකී ගුරුවරයාගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කාර්ය සඵලත්වය උදෙසා ඔහු නිරන්තර වෙනස් වන දැනුම උකහා ගැනීමේ ශක්‍යතාවකින් හෙබි විය යුතු අතර එය ශිෂ්‍යයා වෙත සම්ප්‍රේෂණය කරවනු වස් වෘත්තීය නෛපුණ්‍යයකින් ද යුක්ත විය යුතු ය. වත්මන් ගුරු භූමිකාව ශිෂ්‍යයාට දැනුම ලබාදෙන්නෙකු පමණක් නොව ඉගෙනීමට අවශ්‍ය පහසුකම් සපයන්නෙකු (සම්පත්දායකයෙක්) තත්ත්වයට පත්ව ඇත. ඒ සඳහා ගුරුවරයාට විෂය දැනුම පමණක් ප්‍රමාණවත් නොවන අතර සිය වෘත්තීය කුසලතා සංවර්ධනය නිරන්තරයෙන් ලබාගත යුතු ය. එකී අවශ්‍යතාව පූර්ණත්වයෙහිලා ගුරුවරයාට විවිධ අවස්ථාවන් ඇති අතර වර්තමානය වන විට රජයේ පාසල්වල සේවය කරන ගුරුවරුන්ට පාසලේදීම තම වෘත්තීය සංවර්ධනය කර ගැනීමේ අවස්ථාව ලබා දී ඇත. එය 'පාසල් පාදක ගුරු සංවර්ධනය' (School Based Teacher Development Programme) ලෙස හැඳින්වෙන අතර එය ශ්‍රී ලාංකේය රජයේ පාසල්වල ක්‍රියාත්මක වීමෙහි ස්වභාවය වීමසීම මෙමගින් අපේක්ෂිත ය.

## පර්යේෂණ ගැටලුව

ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල ක්‍රියාත්මක අභ්‍යන්තර ගුරු සංවර්ධන ක්‍රියාවලියේ ස්වභාවය කෙබඳු ද? යන්න මෙම පර්යේෂණයෙහි ගැටලුව වේ.

[1] ආධුනික කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, sirisumana96@yahoo.com

[2] ආධුනික කථිකාචාර්ය, සමාජීයවිද්‍යා හා තුලනාත්මක අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර, g.minuwangoda@gmail

[3] rev.wimalarathana@gmail.com

### පර්යේෂණයේ අරමුණු

ශ්‍රී ලංකාවේ රජයේ පාසල්වල 'පාසල් පාදක අභ්‍යන්තර ගුරු සංවර්ධන වැඩ සටහන' ක්‍රියාත්මක වන ආකාරය විමසා බැලීම මෙහි ප්‍රධාන අරමුණ වන අතර, එහි පවතින ප්‍රබලතා හා දුබලතා හඳුනාගැනීමට ද අපේක්ෂා කෙරේ. මෙකී කරුණු විශ්ලේෂණය කර නව්‍යකරණය සඳහා යෝජනා ඉදිරිපත් කිරීම ද මෙම පර්යේෂණයෙහි අරමුණක්ව පවතී.

### ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ එළඹුම යටතේ සිද්ධි අධ්‍යනයක් ලෙස පර්යේෂණයට බඳුන්වන මෙකී පර්යේෂණයෙහි අරමුණු ඉටුකර ගැනීමෙහිලා යොදා ගන්නා පර්යේෂණ ක්‍රමවේදය වනුයේ විස්තරාත්මක සමීක්ෂණ (Explanatory Survey) ක්‍රමයයි. ඒ සඳහා නූතන පාසල් වර්ගීකරණය අනුව 1 ඒබී, 1සී, 2 වර්ගය, 3 වර්ගය ආදී වර්ග 4න් එක් පාසල බැගින් තෝරාගත් අතර එකී පාසල්වල විදුහල්පතිවරු 4 දෙනා ද, එක් පාසලකින් ගුරුවරු 10 බැගින් ගුරුවරු 40ක් ද, මෙහි නියැදිය වශයෙන් යොදා ගැනුණි.

### සාකච්ඡාව

අධ්‍යාපන අමාත්‍යංශය විසින් ප්‍රකාශිත 2015 වාර්ෂික කාර්ය සාධන සංගණන වාර්තාව අනුව ශ්‍රී ලංකාවේ රජයේ පාසල් 10144 ක් පවතී. එම පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් 4129534 ක් ද, ගුරුවරුන් 233, 883ක් ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි නිරතව සිටී. මෙම ගුරු පිරිස අතර උපාධිධාරී ගුරුවරුන්, විද්‍යාපීඨ ගුරුවරුන් මෙන්ම නුපුහුණු ගුරුවරුන් ද සිටී. මෙයින් විද්‍යාපීඨ මඟින් පැමිණි ගුරුවරුන් පූර්වසේවා ගුරු පුහුණුව ලබා පාසලට පැමිණ ඇත. අනෙක් ගුරුවරුන් සේවාස්ථ ගුරු පුහුණු ලබා හෝ නොලබා සේවයේ යෙදී සිටී. කෙසේ වෙතත් සියලු ම ගුරුවරුන් ඉලක්ක කරමින් සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මෙහි වැදගත් සංධිස්ථානයක් ලෙස පාසලට තම ගුරුවරුන් සංවර්ධනය කරගැනීමේ අවස්ථාව ලබාදීම සඳහන් කළ හැකි ය. එය පාසල් පාදක ගුරු සංවර්ධනය ලෙස හැඳින්වේ. 1996 ශ්‍රී ලංකාවේ ද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම ආරම්භ වූ අතර පසුව විවිධ වෙනස්කම්වලට භාජනය වෙමින් ක්‍රියාත්මක වේ. මෙහි අපේක්ෂාව වනුයේ පාසලේ ගුරුවරුන් සංවර්ධනය කර ගැනීමේ අවස්ථාව එකී පාසල විසින් ම සිදු කරගැනීමට අවස්ථාව ලබා දීම ය. මේ සඳහා අධ්‍යාපන අමාත්‍යංශය මඟින් වාර්ෂිකව පාසල් වර්ගය හා ගුරු සංඛ්‍යාව අනුව මූල්‍යමය පහසුකම් ද ලබාදේ. වර්තමානයේ රජයේ පාසල් විවිධ ස්වරූපයෙන් ගුරු

සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කළ ද, එයින් අපේක්ෂිත අරමුණු සඵල කරගැනීමක් විද්‍යමාන නොවන බව පෙනේ.

ශ්‍රී ලංකාවේ ගුරු සංවර්ධනය අතීතයේ සිටම පැවතුණි. ගුරු පුහුණුව ලෙස හැඳින් වූ එය විධිමත් ලෙස ආරම්භ කරනු ලැබූයේ ලන්දේසීන් විසිනි. 1690 දී පමණ ආගම ව්‍යාප්ත කිරීමේ මූලික අරමුණු සහිතව සිංහල හා දෙමළ මාධ්‍යයෙන් ගුරුවරුන් පුහුණු කිරීමට "සෙමනේරි" නම් ආයතන ආරම්භ කළ අතර පසුව ඉංග්‍රීසීන් විසින් "නෝමල්" පාඨශාලා නමින් ගුරු විද්‍යාල ආරම්භ කර ඇත. මෙසේ ආරම්භව විකාශය වූ ගුරු වෘත්තීය සංවර්ධනය පසුකාලීනව විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ජාතික අධ්‍යාපන ආයතනය වැනි ආයතන මඟින් පූර්ණකාලීන හා අර්ධකාලීන පාඨමාලා වශයෙන් ක්‍රියාත්මක කෙරුණි. "1949 ලංකා විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව අරම්භ කරන තෙක් රජයේ ගුරු විද්‍යාලය උපාධිධාරී ගුරුවරුන් පුහුණු කළේ ය." (රුබේරු,1971: පි.279) ගුරු විද්‍යාල මඟින් ගුරවරුන් පුහුණු කිරීමට විශාල දායකත්වයක් ලැබුණි. 1896 වන විට ආධාර ලැබූ ගුරු විද්‍යාල 14ක් පැවති අතර ලංකා විශ්වවිද්‍යාලය උපාධිධාරී ගුරුවරුන් පුහුණු කිරීම ආරම්භ කරනතෙක්ම එම කාර්යය කරනු ලැබූයේ ද ගුරු විද්‍යාල මඟිනි. එකල මෙරට තුළ විශ්වවිද්‍යාල නොමැති නිසා ගුරවරුන් පුහුණු කිරීමේ රික්තකය පිරවීම ගුරු විද්‍යාල මඟින් ඉටුවිය. පසුකාලීනව පළාත් අධ්‍යාපන අමාත්‍යංශ හා කලාප කාර්යාල මඟින් කෙටි කාලීන ගුරු සංවර්ධන වැඩ සටහන් (සේවාස්ථ පුහුණුව) ක්‍රියාත්මක කෙරුණි. මෙසේ පැවත ආ ගුරු සංවර්ධන ක්‍රියාවලිය පාසලට අවශ්‍ය ලෙස යොදාගැනීමේ පියවරක් ලෙස පාසල් පාදක ගුරු සංවර්ධන ක්‍රියාවලිය 1996 හඳුන්වා දුන් **පාසල් පාදක කළමනාකරණ** වැඩසටහන මඟින් රජයේ පාසල් සඳහා හඳුන්වා දී ඇත. එය 24/2005 චක්‍රලේඛනයෙන් බල ගන්වා ඇත. 2006 දී **පාසල් නගා සිටුවීමේ** වැඩසටහන මගින් එය නැවත බලගන්වා නියමු පරීක්ෂණයක් කර එය ලංකාවේ සෑම පාසලකටම අනිවාර්ය කර 07/2013 චක්‍රලේඛනය නිකුත් කළ ද, නිසි අයුරින් ක්‍රියාත්මක නොවූ හෙයින් 10/2013 නමින් නැවත චක්‍රලේඛනයක් නිකුත් කර ඇත. පාසල් පාදක ගුරු සංවර්ධනය ලෙස හැඳින්වෙන මෙම වැඩ සටහන සඳහා අධ්‍යාපන අමාත්‍යංශය විසින් **පාසල් පාදක ගරු සංවර්ධන මාර්ගෝපදේශ අත්පොත** හඳුන්වා දී ඇත්තේ කළමනාකරුවන්ට හා ගුරුවරුන්ට මාර්ගෝපදේශයන් ලබා ගැනීම සඳහා ය. මෙම පර්යේෂණයේ දී දත්ත ලබා ගැනීම සඳහා ගුරුවරුන්ට ඉදිරිපත් කළ ප්‍රශ්නාවලියට අනුව දත්ත විශ්ලේෂණය මගින් මෙම පාසල් පාදක ගුරු සංවර්ධන වැඩ සටහන පිළිබඳ කරුණු රාශියක් අනාවරණය විය. මේ පිළිබඳ ගුරු දැනුවත්භාවයට දක්වන ලද ප්‍රතිචාර අනුව 97% ක් ගුරුවරුන් මේ පිළිබඳ දැනුවත්භාවය ඇති බව අනාවරණය

විය. එය පාසලේ ක්‍රියාත්මක වීම පිළිබඳ ව විමසීමේ දී 95%ක් ගුරු භවතුන් පාසලෙහි ක්‍රියාත්මක වන බවට ප්‍රතිචාර දක්වා ඇති අතර 5%ක ගුරුවරුන් මේ පිළිබඳ නොදන්නා බවට ප්‍රතිචාර දැක්වීමෙන් පැහැදිලි වන්නේ පාසල් පද්ධතියේ සිටින ගුරුවරුන්ගෙන් යම් පිරිසක් මේ පිළිබඳ අනවබෝධයෙන් ද යුතු බවයි. මෙය නියමිත ආකාරයට පාසල තුළ ක්‍රියාත්මක වන්නේ ද යන්න විමසීමේ දී ඒ සඳහා ගුරුවරුන් 72.5%ක් එසේ ක්‍රියාත්මක වන බව දක්වන ලදී. එලෙසම 27.5%ක ප්‍රමාණයක් ක්‍රියාත්මක නොවන බව සඳහන් කර ඇත. එයින් පාසලේ සමස්තයක් ලෙස අභ්‍යන්තර ගුරු සංවර්ධනය ක්‍රියාත්මක වුව ද නියමිත සැලසුම් සහගත පරිදි ක්‍රියාත්මක වීමේ ගැටලු පවත්නා බව පෙනේ. විදුහල්පතිගේ මැදිහත්වීම සම්බන්ධව විමසීමේ දී 75%ක පිරිසක් විදුහල්පතිගේ දායකත්වය සක්‍රීයව ලැබෙන බවත්, 25%ක් තරමක් එකඟවන බවත් දක්වා ඇත. මෙය වෘත්තීය සංවර්ධනයට අදාළ වීම පිළිබඳ ප්‍රතිචාර අනුව 90% ක් සිය වෘත්තීය සංවර්ධනයට වැදගත් වන බව දක්වා ඇති අතර 10%ක් එය පිළි නොගන්නා බව දක්වයි. මෙම වැඩසටහන්හි ක්‍රියාත්මක වීමේ සාර්ථකත්වය පිළිබඳ 62.5%ක පිරිසක් සාර්ථක බවත්, 27.5%ක් තරමක් එකඟවන බවත්, 10%ක් එකඟ නොවන බවත් ප්‍රකාශකර ඇත. අභ්‍යන්තර ගුරු සංවර්ධන වැඩසටහන් වල දූර්වලතා පිළිබඳ විමසීමේදී 35%ක පිරිසක් පාසල් පද්ධතියේ දූර්වලතා පවතින බවත්, 42.5%ක පිරිසක් දූර්වලතා ඇති බවට තරමක් එකඟවන බව දක්වා ඇති අතර 22.5%ක පිරිසක් දූර්වලතා ඇති බවට එකඟ නොවන බවත් සඳහන් කර ඇත. මෙම ප්‍රතිචාර අනුව අභ්‍යන්තර ගුරු සංවර්ධන ක්‍රියාවලියේ තව දුරටත් විවිධ හේතු කාරණා මත දූර්වලතා පවතින බව පෙනී යයි. ගුරු අදහස අනුව මෙම වැඩ සටහනෙහි දූර්වලතා ලෙස ඉදිරිපත් කරනුයේ,

- සැලසුම් සහගත පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක නොවීම
- නිසි අධීක්ෂණයක් නොමැතිවීම
- සුදුසුකම් සහිත සම්පත් දායකයින් නොමැතිවීම
- ගුරුවරුන්ගේ සක්‍රීය දායකත්වය නොමැති වීම
- ලේඛනවලට පමණක් සීමා වීම
- අවශ්‍යතාව අනුව සිදු නොවීම

මේ අනුව පාසල් පාදක අභ්‍යන්තර ගුරු සංවර්ධන වැඩ සටහන පාසල්වල ක්‍රියාත්මක වීමේ දී විවිධ සාධනීය හා නිශේධනීය ලක්ෂණ කිහිපයක් හඳුනා ගත හැකි අතර පහත නිගමනයන්ට ද එළඹිය හැක.

## නිගමනය

ගුරු ප්‍රශ්නාවලිය, විදුහල්පති සම්මුඛ සාකච්ඡා හා ලේඛනගත තොරතුරු සමග දත්ත ත්‍රිකෝණීකරණය මගින් පහත නිගමන සඳහා එළඹිය හැකි විය. අභ්‍යන්තර ගුරු වෘත්තිය සංවර්ධනය පිළිබඳ ගුරුවරුන් දැනුවත් ව සිටිය ද ඒ පිළිබඳ ගැඹුරු අවබෝධයක් ගුරුවරුන් සතුව නොමැති බව හා ඔවුන්ගේ ඒ පිළිබඳ ඍණාත්මක ආකල්ප ඇති බව, සැලසුම්කරණ අඩුපාඩු පවතින බව, අභ්‍යන්තර නියාමනය සාර්ථකව සිදු නොවන බව, සම්පත් දායකයන් කෙරෙහි විශවාසනීයත්වයක් ගුරු ප්‍රජාවෙහි නොමැතිවීම ආදිය අනාවරණය වූ අතර විදුහල්පති අදහස් අනුව පාසල් කළමනාකරණයට එය අනවශ්‍ය බරක් බවත්, මූල්‍ය සම්පත් හා සම්පත්දායකයින් සොයා ගැනීමේ දී විදුහල්පතිවරුන් විවිධ දුෂ්කරතාවලට මුහුණපාන බවත් අනාවරණය විය.

ප්‍රමුඛ පදඃ රජයේ පාසල්, ගුරු සංවර්ධනය, ගුරු පුහුණුව, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය

## ආශ්‍රිත ග්‍රන්ථ

බුත්පිටිය, ජේ. (1996) ගුරු සේවා වෘත්තීය පදනම, සාර ප්‍රකාශන, කොට්ටාව.

ගුණසේකර,එස්. (1990) ශ්‍රී ලංකා ගුරු සේවය හා වෘත්තීයිකභාවය, සුනෙර ප්‍රකාශන, නුගේගොඩ.

සේනාධීර,එස්. සහ වනසිංහ,එස්. (2006) ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපනය අරමුණු, අවශ්‍යතා හා භාවිතය, නො.675, මරදාන පාර, ගොඩගේ, කොළඹ.

De Silwa, C.R. and De silwa D.(1990), Education in Sri lanka-1948/1988, Navarag New Delhi.

SBTD, Trans fr ming Claas practices.Education departmene hq amman